ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයට සිසුන් බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය හා ආනුෂංගික කරුණු

1. එක් වර්ෂයක් සඳහා එක් වෛද්‍ය ශිෂ්‍ය කණ්ඩායමක් පමණක් බඳවා ගනු ලැබේ.

2. එක් වර්ෂයක් සඳහා වෛද්‍ය පීඨයට බඳවා ගනු ලබන සමස්ත වෛද්‍ය ශිෂ්‍ය සංඛ්‍යාව 150 කට සීමාවන අතර, ගෙවීමේ පදනම මත බඳවා ගනු ලබන දේශීය සිවිල් වෛද්‍ය ශිෂ්‍ය සංඛ්‍යාව උපරිම වශයෙන් 100 ක් වේ.

3. වෛද්‍ය ශිෂ්‍යයින් බඳවා ගැනීමේදී ත්‍රිවිධ හමුදා සිසුන්, විදේශීය සිසුන් හා දේශීය සිසුන් යන අනුපිළිවෙලට ප්‍රමුඛතාව ලබා දෙනු ලැබේ.

4. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි වෛද්‍ය සිසුන් බඳවා ගැනීමේ නිර්ණායකයක් වශයෙන් 1.4000 ක් හෝ ඊට ඉහළ අවම Z අගයක් පවත්වා ගැනීමට කටයුතු කරනු ඇත.

5. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයට බඳවා ගනු ලබන සෑම දේශීය සිවිල් වෛද්‍ය සිසුන් කණ්ඩායමකම 10% ක ප්‍රතිශතයක් පූර්ණ ශිෂ්‍යත්ව මත බඳවා ගැනීමට කටයුතු යොදනු ලබන අතර එම සිසුන් අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය හරහා තෝරා ගැනීමට කටයුතු කරනු ලැබේ.

6. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයට බඳවා ගනු ලබන සිසුන්ට විවෘත විශ්වවිද්‍යාලය හැර අනෙකුත් රාජ්‍ය විශ්ව විද්‍යාලවල පූර්ණකාලීන අභ්‍යන්තර ශිෂ්‍යයින් වශයෙන් ලියාපදිංචි වීමටත්, විවෘත විශ්වවිද්‍යාලය හැර අනෙකුත් රාජ්‍ය විශ්ව විද්‍යාලවල පූර්ණකාලීන අභ්‍යන්තර ශිෂ්‍යයින් වශයෙන් ලියාපදිංචි වී ඇති ශිෂ්‍යයින්ට ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ලියාපදිංචි වීමටත් අවස්ථාව හිමි නොවේ.

7. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ පාඨමාලාවට සහභාගී වන සිවිල් සිසුන් සඳහා විශේෂ නිළ ඇඳුමක් අනිවාර්ය නොකරන අතර, අනෙකුත් වෛද්‍ය පීඨවල සිසුන් විශ්වවිද්‍යාල දේශන සඳහා සහභාගී වන අයුරින් ඔවුන්ටද දේශන සඳහා සහභාගී වීමට අවස්ථාව ලබා දෙනු ලැබේ.

8. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ සිසුන්ට සායනික පුහුණුව සඳහා සුදුසු පරිදි සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මගින් රෝහල් නිශ්චිතව තෝරා වෙන් කිරීමට කටයුතු කරනු ලැබේ.

9. සීමාවාසික පුහුණුව හෝ රාජ්‍ය සේවය සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ සිසුන් රජයේ රෝහල්වලට බඳවා ගන්නා බවට වගකීමක් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය විසින් භාර නොගන්නා අතර, එම බඳවා ගැනීම් පවතින පුරප්පාඩු අනුව පමණක් සිදුකරන බවට එකඟතාවයක් සිසුන් ලියාපදිංචි කිරීමේදී ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

__වෛද්‍ය පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය__

10. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති වෛද්‍ය පීඨ අධ්‍යයන කාර්ය මණ්ඩලයන්හි සේවය කළ නිලධාරීන් එම කාර්ය මණ්ඩල සේවයෙන් ඉවත්ව වසර පහක කාලසීමාවක් ගත වූ පසුව පමණක් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීමට කටයුතු කරනු ලබන අතර, සප්ත වාර්ෂික නිවාඩු ලබා ගැනීමේදී හා සේවයෙන් විශ්‍රාම ගැනීමේදී මෙම කොන්දේසිය අදාළ කරගනු නොලැබේ.